# ජපන් භාෂාව

## විෂය නිර්දේශය

# 日本語

## 12 - 13 ශ්‍රේණි

(2017 සිට ක්‍රියාත්මක වේ)

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය
විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව
විද්‍යුත් තැපැල **info@nie.lk**

**ජපන් භාෂාව**

**විෂය නිර්දේශය**

**12,13 ශ්‍රේණි**

**ප්‍රථම මුද්‍රණය - 2017**

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## පටුන


| | |
|---|---|
| පෙරවදන | 04 |
| හැඳින්වීම | 05 |
| ජාතික පොදු අරමුණු | 06 |
| මූලික නිපුණතා | 08 |
| විෂය අධ්‍යයනයේ අරමුණු | 10 |
| ජාතික පොදු අරමුණු සහ විෂය අධ්‍යයනයේ අරමුණු අතර සම්බන්ධතාව දැක්වෙන වගුව | 11 |
| විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම | 12 |
| විෂය නිර්දේශය 12 ශ්‍රේණිය | 13 |
| විෂය නිර්දේශය 13 ශ්‍රේණිය | 20 |
| ඇමුණුම i | 26 |
| ඇමුණුම ii | 27 |
| ඇමුණුම iii | 28 |
| ඇමුණුම iv | 40 |
| ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය | 43 |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 26 |
| තක්සේරුව හා ඇගයීම | 45 |
| නිර්දිෂ්ට ග්‍රන්ථ හා ආශ්‍රිත ග්‍රන්ථ | 46 |
| විෂය නිර්දේශ සම්පාදක මණ්ඩලය | 47 |

# පෙරවදන

නව විෂයමාලා ප්‍රතිසංස්කරණය යටතේ 12 සහ 13 ශ්‍රේණි සඳහා 2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට මෙම ජපන් භාෂා විෂය නිර්දේශය සම්පාදනය කර ඇත. 12 වන ශ්‍රේණිය සඳහා ප්‍රධාන නිපුණතා 10ක් යටතේ නිපුණතා මට්ටම් 27ක් ද 13 වන ශ්‍රේණිය සඳහා ප්‍රධාන නිපුණතා 10ක් යටතේ නිපුණතා මට්ටම් 28ක් ද අන්තර්ගත කර ඇත.

නව විෂය නිර්දේශය සම්පාදනය කිරීමට පෙර විවිධ පළාත්වල ජපන් භාෂාව විෂය ඉගැන්වීමේ නිරත ගුරුභවතුන් නියෝජනය වන සේ ගුරුභවතුන් නියැදියකගෙන් ලබා ගත් අදහස් හා යෝජනා සැලකිල්ලට ගන්නා ලදි.

ඒ අනුව පෙර පැවැති විෂය නිර්දේශයට වෙනස්කම් කිහිපයක් සිදු කරමින් නව විෂය නිර්දේශය සකස් කර ඇත. ශිෂ්‍යයන්ට වසර 2ක් තුළ ඉගෙනීමට නියමිත ව තිබූ කන්ජි අක්ෂර 500ක ප්‍රමාණය කන්ජි අක්ෂර 350 දක්වා අඩු කර ඇත. තව ද ප්‍රිය උපදවන ආකාරයට සාහිත්‍ය ඉගැන්වීමට පෙලඹවිය හැකි වන සේ සාහිත්‍යයේ අන්තර්ගතයේ ද වෙනසක් සිදු කර ඇත. ජපන් භාෂා සන්නිවේදන කුසලතා වර්ධනය කිරීම සහ ජපන් සංස්කෘතිය සහ ජන සමාජය පිළිබඳ පුළුල් දැනුමක් ලබා දීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි.

අ.පො.ස උසස් පෙළ ජපන් භාෂා විෂය නිර්දේශයෙහි විෂය අන්තර්ගතය සහ මූලික ඉගැන්වීම සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය පිළිබඳ ව ගුරුවරයාට මඟ පෙන්වීම අරමුණු කරගෙන 12 සහ 13 ශ්‍රේණි සඳහා ගුරු මාර්ගෝපදේශ දෙකක් ද සකස් කෙරේ. ඒවා පරිශීලනය කිරීමෙන් ජපන් භාෂා විෂය නිර්දේශය කාර්යක්ෂම ව යොදා ගැනීම සඳහා පුළුල් අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත.

ව්‍යාපෘති නායක

# හැඳින්වීම

නූතන ලෝකයේ තාක්ෂණික දැනුමෙන් ඉදිරියෙන් සිටින ජපානය ආර්ථික, ආධ්‍යාපනික, සංස්කෘතික ක්ෂේත්‍රවල ද ඉහළ සාධන මට්ටමක් අත්පත් කර ගත් රටකි. ජපන් භාෂාව ජපානය තුළ පමණක් ව්‍යවහාර වුව ද වර්තමානයේ බොහෝ රටවල ජනතාව විසින් හැදෑරීමට ප්‍රියතාවක් දක්වනු ලබන භාෂාවක් බව, වාර්ෂික ව ජපානයේ ජපන් භාෂා පදනම විසින් පවත්වනු ලබන ජපන් භාෂා ප්‍රවීණතා විභාගයට පෙනී සිටින විවිධ රටවල ශිෂ්‍ය සංඛ්‍යාව වසරින් වසර ඉහළ යාමෙන් තහවුරු වේ.

ජපානය තාක්ෂණික දැනුමෙන් ඉහළ තලයකට ළඟා වී ඇතත් සිය ජාතික උරුමය සහ අනන්‍යතාව රැක ගැනීමට ද නිරන්තරයෙන් කටයුතු කිරීම මඟින් තිරසාර සංවර්ධනයක් අත්පත් කර ගැනීමට සමත් ව ඇති රටකි. සංවර්ධනය කරා යන ගමනේ දී ශ්‍රී ලාංකික අපට ද ජපානය ඇසුරින් බොහෝ පාඩම් උගත හැකි ය. නිදසුන් ලෙස අන්‍යයන්ට ගරු කිරීම, කාල කළමනාකරණය, කසළ කළමනාකරණය ආදිය පෙන්වා දිය හැකි ය.

ශ්‍රී ලාංකිකයන් දැනට දශක හතරකට ආසන්න කාලයක සිට ජපන් භාෂාව හැදෑරීමට යොමු වී ඇත. 1979 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාවට පළමුවෙන් ම ජපන් භාෂාව ඇතුළු කරන ලද අතර අද වන විට අ.පො.ස සාමාන්‍ය පෙළ හා උසස් පෙළ සඳහා මෙන් ම විශ්වවිද්‍යාල තුළ දීත් ජපන් භාෂාව ඉගෙනීමට අවස්ථාව සැලසී ඇත.

ජපන් භාෂාව ඉගෙනීමෙන් ජපානය සහ ජපන් සංස්කෘතිය පිළිබඳ තොරතුරු, උසස් තාක්ෂණික ඥානය ලබා ගැනීමට උපකාර වනවා මෙන් ම විවිධ ක්ෂේත්‍රවල රැකියා අවස්ථා උදා කරගැනීමට ද හැකි වනු ඇත. ජපානය තුළ අධ්‍යාපන කටයුතු කර ගැනීම සඳහා ශිෂ්‍යත්ව දිනා ගැනීමට ද ජපන් භාෂා දැනුම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විෂය නිර්දේශය හැදෑරීමෙන් ශිෂ්‍යයන් මෙම මහඟු ප්‍රතිඵල අත් කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

# ජාතික පොදු අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟාවීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මඟින් පුද්ගල හා ජාතික අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යූහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

ii. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

iv. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

vi පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

vii ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානාත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(උපුටා ගැනීම ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත

## (I) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## (II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්

- චිත්තවේගී බුද්ධිය

## (III) පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

## (IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම.
තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම.
හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ
වාසිදායක හා තිරසර ජීවනෝපායක නිරත වීම.
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

## (V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

## (VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

## (VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම - ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

## ජපන් භාෂාව විෂය අධ්‍යයනයේ අරමුණු

01 ජපන් භාෂාව කතා කිරීම, ලිවීම, කියවීම හා ශ්‍රවණය මඟින් භාෂා ශක්‍යතාව ඇති කර ගැනීම.

02 පෙරදිග ලෝකයේ සංස්කෘති හා ඊට ආවේණික ලක්ෂණ ගවේෂණය කරමින් ජපන් ජාතිකයන් සමඟ සම්බන්ධතා ගොඩනගා ගැනීම.

03 ජපන් භාෂක සමාජයට අයත් සමාජ සංස්කෘතික හර පද්ධති හඳුනා ගෙන අගය කිරීම.

04 සාහිත්‍යයික, විද්‍යාත්මක හා සමාජීය දැනුම වර්ධනය කර ගනිමින් වෙනස් වන ලෝකය සමඟ සමීප සම්බන්ධතා ගොඩනගා ගැනීම.

05 ජපන් සමාජය තුළ ප්‍රදර්ශනය වන ආචාරශීලී බව, සංයමය හා මානව ගුණාංග ඇගයීම.

06 අන්තර්ජාතික සම්බන්ධතා ගොඩනගා ගනිමින් දේශීය ආර්ථික සංවර්ධනයට සහාය වීම.

07 අන්තර්ජාතික ප්‍රජාව හමුවේ අභිමානවත් ලෙස කටයුතු කිරීමේ හැකියාව ලබා ගැනීම.

08 විචාරශීලි චින්තනය, රසාස්වාදය, නිර්මාණාත්මක හැකියාව මඟින් සමබර පෞරුෂයක් ඇති කිරීම.

| ජාතික පොදු අරමුණු | විෂය අරමුණු | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| 1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීමෙන් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම. | | ✓ | | | | | | ✓ |
| 2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම. | | | | ✓ | | | | |
| 3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගමව බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම. | ✓ | | ✓ | | | | ✓ | |
| 4. පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම. | | ✓ | | | ✓ | | | |
| 5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධානත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම. | ✓ | | | ✓ | | | | ✓ |
| 6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම. | ✓ | | | | | | ✓ | |
| 7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදුවන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගරනීමට පුද්ගලයින් සූදානම් කිරිම හා සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම. | | | | ✓ | | | | ✓ |
| 8. ජාත්‍යන්තර ප්‍රජාව ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම. | | | | | ✓ | ✓ | ✓ | |

## ජපන් විෂය නිර්දේශය - 12, 13 ශ්‍රේණිය
## පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලසුම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 12 | I | 1.1, 1.2,1.3,2.1,3.1,4.1,6.1,9.1 | 100 |
| | II | 2.2, 4.1, 5.1, 5.2, 5.3, 5.4, 5.5 6.2,6.3,7.1, 9.2 | 100 |
| | III | 3.2,4.2, 7.2, 7.3,8.1,8.2 8.3, 9.3, 10.1, 10.2 | 100 |
| 13 | I | 1.1, 1.2, 1.3, 1.4, 2.1, 3.1, 4.1 4.2, 6.1, 9.1, 9.2 | 100 |
| | II | 1.1, 1.2, 1.3, 1.4, 2.2, 3.2, 3.3, 4.1,4.2,5.1, 7.1, 7.2 8.1 8.2, 9.3 | 100 |
| | III | 1.1, 1.2, 1.3, 1.4,2.2,3.3,4.2 5.2, 6.2,7.3, 8 3, 8.4, 10.1, 10.2, 10.3 | 100 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 ශබ්ද සහ අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි. | 1.1 ජපන් භාෂාවේ ශබ්ද හඳුනා ගෙන උච්චාරණය කරයි.<br>1.2 හිරගනා අක්ෂර ලියයි.<br>1..3 කතකනා අක්ෂර ලියයි. | • ජපන් භාෂාවේ මූලික ශබ්ද රටා<br>• හිරගනා අක්ෂර (ඇමුණුම i)<br>• කතකනා අක්ෂර (ඇමුණුම ii)<br>• සුවිශේෂ ශබ්ද රටා<br>- දීර්ඝ අක්ෂර<br>- හල් කිරීම<br>- බැඳි අක්ෂර<br>- ඝෝෂ ශබ්ද | • ජපන් භාෂාවේ ශබ්ද හඳුනා ගෙන ශබ්ද නිවැරදි ව උච්චාරණය කරයි.<br>• හිරගනා අක්ෂර නිවැරදි ව ලියයි.<br>• කතකනා අක්ෂර නිවැරදි ව ලියයි.<br>• හිරගනා අක්ෂර හා කතකනා අක්ෂර භාවිත කර නිවැරදි ව වචන, වාක්‍ය ලියයි. | 30 |
| 2.0 සවන් දී අවශ්‍ය තොරතුරු ග්‍රහණය කරගෙන ප්‍රතිචාර දක්වයි. | 2.1 දෛනික ජීවිතයට අදාළ සංවාදවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br><br>2.2 දෛනික ජීවිතයට අවශ්‍ය උපදෙස්වලට සහ තොරතුරුවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | • පෞද්ගලික තොරතුරු<br>• අවසර ගැනීම හා ප්‍රතික්ෂේප කිරීම.<br><br>• භාණ්ඩ මිල දී ගැනීම.<br>• නිවේදන<br>• ඇණවුම් කිරීම<br>• මඟ පෙන්වීම<br>• දුරකථන සංවාද සිදු කිරීම<br>• සම්මුඛ සාකච්ඡා | • පෞද්ගලික තොරතුරුවලට සවන් දී මතකයෙන් ඉදිරිපත් කරයි.<br>• අසන්නන් කෙරෙහි අවධානය යොමු කරමින් සංවාදයේ යෙදෙයි.<br>• උචිත පරිදි පිළිතුරු සපයයි.<br>• දෛනික ජීවිතය හා සම්බන්ධ සංවාදවලට ප්‍රතිචාර දක්වයි.<br><br>• සවන් දී අවබෝධ කර ගෙන උපදෙස් අනුව කටයුතු කරයි.<br>• භාණ්ඩවල මිල නිවැරදි ව හඳුනා ගෙන ප්‍රකාශ කරයි.<br>• නිවේදනවලට සවන් දී තොරතුරු අනුව ප්‍රතිචාර දක්වයි.<br>• සවන් දී තොරතුරු ලබාගෙන අවශ්‍ය භාණ්ඩ නිවැරදි ව ඇණවුම් කරයි.<br>• දුරකථන පණිවිඩවලට සවන් දී ආචාරශීලී ව ප්‍රතිචාර දක්වයි. | 27 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 නිරවුල් සහ ඵලදායී ලෙස භාෂාව භාවිත කරමින් සන්නිවේදනයේ යෙදෙයි. | 3.1 දෛනික ජීවිතයට අවශ්‍ය තොරතුරු ජපන් බසින් හුවමාරු කර ගනියි.<br><br>3.2 ජපන් බසින් අවශ්‍ය තොරතුරු සහ උපදෙස් ලබා දෙයි. | • පෞද්ගලික තොරතුරු හුවමාරු කරගැනීමේ සංවාද<br>• අවසර ගැනීම හා ප්‍රතික්ෂේප කිරීම.<br>• භාණ්ඩ මිල දී ගැනීම.<br>• නිවේදන<br>• ඇණවුම් කිරීම<br>• මඟ පෙන්වීම<br>• දූරකථන සංවාද සිදුකිරීම<br>• සම්මුඛ සාකච්ඡා | • සරල සංවාද ගොඩනගමින් තොරතුරු හුවමාරු කර ගනියි.<br>• ජපන් බසින් තොරතුරු සහ උපදෙස් ලබා දෙයි.<br>• ජපන් බසින් සංවාදයේ යෙදීමට ඉදිරිපත් වෙයි.<br>• උචිත යෙදුම් භාවිත කරයි.<br>• නිවැරදි යෙදුම් භාවිත කර ඇණවුම් කරයි<br>• දුරකථන සංවාදයේ යෙදෙයි. | 45 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 4.0 මූලික ව්‍යාකරණ රටා හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි. | 4.1 මූලික ව්‍යාකරණ රටා හඳුනා ගෙන ව්‍යාකරණානුකූල ව වාක්‍ය නිර්මාණය කරයි. | • නාම පද, සර්වවාචි පද,<br>• වාක්‍ය සම්බන්ධක පද,<br>• ප්‍රශ්න වාචි පද<br>• සංඛ්‍යා, ගණක පද,<br>• විශේෂණ පද<br>• ක්‍රියා විශේෂණ | • නාම පද, සර්වවාචි පද උචිත ලෙස භාවිත කර ව්‍යාකරණානුකූල වාක්‍ය ගොඩ නඟයි.<br>• අවස්ථානුකූල ව ප්‍රශ්නවාචී පද යොදා ගනිමින් තොරතුරු විමසා දැනගනියි.<br>• සංඛ්‍යා, ගණක පද, කාලය නිවැරදි ව ප්‍රකාශ කරයි.<br>• විශේෂණ පද, ක්‍රියා විශේෂණ නිවැරදි ව භාවිත කර වාක්‍ය ගොඩ නඟමින් කෙටි රචනා ලියයි. | 75 |
| | 4.2 ක්‍රියා පද කාණ්ඩ යටතේ හඳුනා ගෙන විවිධ ස්වරූපවලට වරනඟයි. | • ව්‍යාකරණ ඇමුණුම (iii) | • ක්‍රියා පද කාණ්ඩ වෙන් වෙන් ව විවිධ ස්වරූපවලට වරනඟයි.<br>• උගත් ව්‍යාකරණ රටා ඇසුරින් සංවාදයේ යෙදෙයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 කංජි අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි. | 5.1 අක්ෂරවල ආරම්භය සහ විකාශය පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කංජි අක්ෂර භාවිත කරයි.<br><br>5.2 කංජි අක්ෂර නිවැරදි ව ලියයි.<br><br>5.3 කංජි අක්ෂර නිවැරදි ව කියවයි.<br><br>5'4 අර්ථානුකූල ව කංජි අක්ෂර භාවිත කර ලියයි.<br><br>5.5 කංජි අක්ෂර භාවිත කර , hsQ pk j ල අර්ථ දක්වයි. | • කංජි අක්ෂර (ඇමුණුම iv)<br>• කංජි අක්ෂර පිළිබඳ හැඳින්වීම.<br>• කංජි අක්ෂරවල ඓතිහාසික පසුබිම<br>• කංජි අක්ෂර භාවිත කිරීමේ වැදගත්කම<br>• කංජි අක්ෂර ලිවීමේ මූලික රීති<br>• කංජි අක්ෂර ලිවීමේ පියවර<br><br>• කංජි අක්ෂර කියවීමේ ක්‍රම<br>- ඔන්යොමි<br>- කුන්යොමි<br><br>• කංජි අක්ෂරවල අර්ථය | • කංජි අක්ෂරවල ආරම්භය සහ විකාශය කෙටියෙන් විස්තර කරයි.<br><br>• ලිවීමේ නිවැරදි පියවර අනුව කංජි ලියයි.<br><br>• කංජි අක්ෂර ඔන්යොමි සහ කුන්යොමි ක්‍රම අනුව නිවැරදි ව කියවයි.<br><br>• අර්ථයට අනුව නිවැරදි කංජි අක්ෂරය භාවිත කර ලියයි.<br><br>• කංජි ඇතුළත් වචන අර්ථාන්විත ව භාවිත කරයි. | 33 |
| 6.0 ලේඛන අවබෝධයෙන් යුතු ව කියවයි. | 6.1 වාක්‍ය, සංවාද, ඡේද සහ රචනා නිවැරදි ව ශබ්ද නගා කියවයි.<br><br>6.2 අර්ථය අවබෝධ කර ගනිමින් කියවයි.<br><br>6.3 ලේඛන කියවා අවශ්‍ය තොරතුරු ග්‍රහණය කර | • සංස්කෘතික තොරතුරු<br>• කෙටි පණිවිඩ<br>• ලිපි<br>• විද්‍යුත් ලිපි<br>• සංවාද<br>• ඡේද<br>• රචනා | • ජපන් බසින් ලියන ලද වාක්‍ය ඡේද සහ සංවාද නිවැරදි ව ශබ්ද නගා කියවයි.<br>• දෛනික ජීවිතයට අවශ්‍ය තොරතුරු සහිත ලිපි, කෙටි පණිවිඩවල අර්ථය අවබෝධ කර ගනිමින් කියවයි.<br>.• ලේඛන කියවා අවබෝධ කර ගත් තොරතුරු අනුව ප්‍රතිචාර දක්වයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 ලිඛිත ව අදහස් ප්‍රකාශ කරයි. | ගනියි.<br>7.1 ව්‍යාකරණානුකූල අර්ථාන්විත වාක්‍ය ලියයි.<br>7.2 අදහස් ක්‍රමානුකූල ව පෙළගස්වමින් ලියයි.<br>7.3 ලිවීම මඟින් අදහස්/තොරතුරු හුවමාරු කර ගනියි. | • කෙටි පණිවිඩ<br>• විද්‍යුත් ලිපි<br>• ලිපි<br>• දැන්වීම් | • ව්‍යාකරණානුකූල අර්ථාන්විත වාක්‍ය ලියයි.<br>• අදහස් නිරවුල් ව පෙළගස්වා රචනා පණිවිඩ ආදිය ලියයි.<br>• ලිපි, විද්‍යුත් ලිපි, කෙටි පණිවිඩ සහ දැන්වීම් මඟින් අදහස්/තොරතුරු හුවමාරු කර ගනියි.<br>• ඡේද ලිපි ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු සපයයි. | 21 |
| 8.0 සන්නිවේදන කුසලතා දියුණු කර ගැනීම සඳහා ජපන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසටත් සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසින් ජපන් බසටත් පරිවර්තනය කරයි. | 8.1 අර්ථ අවබෝධයෙන් කියවා පරිවර්තනය කරයි<br>8.2 භාෂාවට ආවේණික විශේෂතා හඳුනා ගනිමින් ජපන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසට පරිවර්තනය කරයි.<br>8.3 පරිවර්තනයට ලක් වන භාෂාවට ආවේණිත විශේෂ ලක්ෂණ හඳුනා ගනිමින් සිංහල/දෙමළ/ඉංග්‍රීසි බසින් ජපන් බසට පරිවර්තනය කරයි. | • වචන<br>• වාක්‍ය ඛණ්ඩ<br>• වාක්‍ය<br>• ඡේද<br>• සංවාද | • පරිවර්තනයට අදාළ වන භාෂාත්මක විශේෂතා හඳුනා ගෙන පරිවර්තනය කරයි.<br>• පරිවර්තනයට ලක් වන භාෂාවේ වාක් කෝෂය පිළිබඳ පරිචය ප්‍රදර්ශනය කරයි.<br>• සමස්ත අදහස ගැබ් වන පරිදි පරිවර්තනය කරයි.<br>• පරිවර්තනය කරනු ලබන භාෂාවට ආවේණික සංස්කෘතිය හඳුනා ගෙන මුල් අදහස වෙනස් නො වන ලෙස පරිවර්තනය කරයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 ජපානයේ ආචාර ධර්ම, සමාජ සම්මත, සන්නිවේදන ක්‍රමෝපාය සහ නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිත කරමින් සන්නිවේදනයේ යෙදෙයි. | 9.1 ජපානයේ සමාජ සම්මත හඳුනා ගෙන සන්නිවේදනය සඳහා භාවිත කරයි. | • ආචාර කිරීමේ සහ සුබ පැතීමේ යෙදුම් සහ ක්‍රම | • නිවැරදි යෙදුම් භාවිත කර අවස්ථානුකූල ව ආචාර කරයි. | 15 |
| | 9.2 සන්නිවේදන ක්‍රමෝපාය සහ නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි. | • නිර්වාචික සන්නිවේදන ක්‍රම<br>- සාත්ත්වික අභිනය<br>- අංග චලනය<br>- ඉරියව්‍ව | • ජපන් ජාතිකයන්ගේ නිර්වාචික සන්නිවේදන ක්‍රම හඳුනා ගෙන අවස්ථානුකූල ව භාවිත කරයි. | |
| | 9.3 ජපන් භාෂාවේ සහ සංස්කෘතියට අයත් ආචාර ධර්ම සහ සන්නිවේදන ක්‍රමෝපා සමඟ තම මවු බසෙහි සහ සංස්කෘතියේ ඇති සමාන-අසමානතා හඳුනා ගෙන සන්නිවේදනයේ යෙදෙයි. | • ජපන් සංස්කෘතියට අනන්‍ය වූ ආචාර ධර්ම<br><br>• සිරිත් විරිත්<br><br>• සාර්ථක ව සන්නිවේදනය කිරීමේ ක්‍රමෝපාය | • ජපානයේ ආචාර ධර්ම හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයෙන් යුතු ව සංවාදයේ යෙදෙයි.<br><br>• ජපන් ජාතිකයන්ගේ සිරිත්-විරිත්වලට ගරු කරමින් ඔවුන් සමඟ සන්නිවේදනයේ යෙදෙයි.<br><br>• දෙරටේ සංස්කෘතියට අනන්‍ය වූ ලක්ෂණ සහ ආචාර ධර්ම හඳුනා ගෙන විස්තර කරයි. | |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 ජපන් සංස්කෘතිය, ජන සමාජය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව භාවිත කරයි. | 10.1 ජපානයේ භූ විෂමතා ලක්ෂණ සහ දේශගුණය පිළිබඳ අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි. | • භූ විෂමතාව සහ දේශගුණය, | • ජපානයේ භූ විෂමතාව සහ දේශගුණය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි. | 9 |
| | 10.2 ජපන් ජාතිකයන්ගේ ජීවන රටාව පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව භාවිත කරයි. | • ආහාර පාන<br>• නිවාස හා වාසස්ථාන<br>• ඇඳුම් පැලඳුම්<br>• කලා ශිල්ප<br>• ප්‍රවාහණ ක්‍රම<br>• විනෝදාංශ | • ජපන් සංස්කෘතිය පිළිබඳ ව සහ ජපන් ජාතිකයන්ගේ ජීවන රටාව පිළිබඳ ව තොරතුරු සොයා විවිධ මාතෘකා යටතේ සාරාංශගත කරයි.<br>• ජපන් සංස්කෘතිය සහ ජන සමාජය පිළිබඳ ව ඡේද කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>• ජපන් සංස්කෘතිය පිළිබඳ ව සංවාද ගොඩ නඟයි. | |

13 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 කන්ජි අක්ෂර හඳුනා ගෙන භාවිත කරයි. | 1.1 කන්ජි අක්ෂර නිවැරදි ව ලියයි.<br><br>1.2 කන්ජි අක්ෂර නිවැරදි ව කියවයි.<br><br>1.3 අර්ථානුකූල ව කන්ජි අක්ෂර භාවිත කර ලියයි.<br><br>1.4 කන්ජි අක්ෂර භාවිත කර ලියූ වචනවල අර්ථ දක්වයි. | • කන්ජි අක්ෂර ඇමුණුම iv<br>• කන්ජි අක්ෂර ලිවීමේ පියවර<br>• කන්ජි අක්ෂර කියවීම් ක්‍රම<br>- ඔන්යොමි<br>- කුන්යොමි<br>• කන්ජි අක්ෂරවල අර්ථය<br>• කන්ජි අක්ෂර සහිත වචන<br>• ඡේද | • නිවැරදි ලිවීමේ පියවර අනුගමනය කරමින් කන්ජි අක්ෂර ලියයි.<br>• කන්ජි අක්ෂරවල විවිධ කියවීමේ ක්‍රම හඳුනා ගෙන නිවැරදි ව කියවයි.<br>• අර්ථයට අනුව නිවැරදි කන්ජි අක්ෂර භාවිත කර ලියයි.<br>• කන්ජි අක්ෂර ඇතුළත් වචන අර්ථවත් ව භාවිත කරයි. | 51 |
| 2.0 සවන් දී අවශ්‍ය තොරතුරු ග්‍රහණය කර ගෙන ප්‍රතිචාර දක්වයි. | 2.1 දෛනික සහ විධිමත් සංවාදවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.<br><br>2.2 දෛනික සහ විධිමත් උපදෙස්වලට හා තොරතුරුවලට සවන් දී අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි. | • දෛනික සංවාද<br>• විධිමත් සංවාද<br>• අවසර ගැනීම් හා ප්‍රතික්ෂේප කිරීම්<br><br>• උපදෙස් ලබා ගැනීම් හා උපදෙස් ලබා දීම<br>• ඉල්ලීම් කිරීම හා ප්‍රතිචාර දැක්වීම.<br>• පුද්ගලයන්, ස්ථාන, රටවල්, අවස්ථා ආදිය පිළිබඳ තොරතුරු<br>• කාලගුණ අනාවැකි<br>• ප්‍රවෘත්ති | • දෛනික සහ විධිමත් ව හසුරුවන සංවාදවලට සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.<br><br>• උපදෙස්වලට හා තොරතුරුවලට සවන් දී අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.<br>• ඉල්ලීම්වලට ප්‍රතිචාර දක්වයි.<br>• පුද්ගලයන් පිළිබඳ තොරතුරුවලට සවන් දී කෙටියෙන් නැවත ඉදිරිපත් කරයි.<br>• රටවල්, ස්ථාන පිළිබඳ තොරතුරු-වලට සවන් දී තම අදහස් දක්වයි.<br>• කාලගුණ අනාවැකිවලට සවන් දී අදහස් පළ කරයි.<br>• ප්‍රවෘත්ති ඇසුරෙන් තොරතුරු සාරාංශ ගත කරයි. | 27 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 භාෂාව භාවිත කර නිරවුල් සහ ඵලදායී ලෙස සන්නිවේදනයේ යෙදෙයි. | 3.1 දෛනික කටයුතුවලට අවශ්‍ය අදහස් හුවමාරු කර ගනියි.<br>3.2 විධිමත් ව භාෂාව හසුරුවයි.<br>3.3 දෛනික සහ විධිමත් මට්ටමින් අවශ්‍ය තොරතුරු සහ උපදෙස් ලබා දීම මඟින් සන්නිවේදනයේ යෙදෙයි. | • පෞද්ගලික තොරතුරු<br>• විධිමත් භාෂා භාවිතය<br>• සංවාද | • පෞද්ගලික තොරතුරු සරල ව ඉදිරිපත් කරයි.<br>• ජපන් බස විධිමත් ව භාවිත කරමින් සංවාදවල යෙදෙයි.<br>• සරල සහ විධිමත් මට්ටමේ සංවාද ගොඩ නඟමින් තොරතුරු හා උපදෙස් හුවමාරු කර ගනියි. | 45 |
| 4.0 ව්‍යාකරණ රටා හඳුනා ගෙන නිවැරදි ව භාවිත කරයි. | 4.1 ව්‍යාකරණ රටා හඳුනා ගෙන ව්‍යාකරණානුකූල ව සහ අර්ථාන්විත ව වාක්‍ය ගොඩ නගයි.<br>4.2 ජපන් භාෂාවට ආවේණික සුවිශේෂ වූ යෙදුම් අවස්ථානුකූල ව අර්ථවත් ව භාවිත කරයි. | • ව්‍යාකරණ ඇමුණුම (iii)<br>• ව්‍යාකරණ ඇමුණුම ( iii )<br>• ගෞරවාන්විත භාෂාව<br>• නිරහංකාර ස්වරූපය<br>• ශිෂ්ට ස්වරූපය | • අදහස් ඉදිරිපත් කිරීමේ දී විවිධ වාක්‍ය රටා භාවිත කරයි.<br>• ව්‍යාකරණානුකූල ව සහ අර්ථාන්විත ව සන්නිවේදනයේ යෙදෙයි.<br>• ජපන් භාෂාවට ආවේණික, සුවිශේෂ යෙදුම් භාවිත කරමින් අදහස් ප්‍රකාශ කරයි.<br>• ව්‍යාකරණ රීති පිළිපදිමින් රචනා, ලිපි ආදිය ලියයි. | 78 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 5.0 තොරතුරු ග්‍රහණය කර ගැනීම සඳහා කියවයි. | 5.1 අවශ්‍ය තොරතුරු රැස් කිරීම සඳහා කියවයි.<br>5.2 අර්ථාවබෝධයෙන් යුතු ව කියවයි. | • ජපන් සමාජීය හා සංස්කෘතික තොරතුරු ඇතුළත් ඡේද සහ රචනා | • ජපන් බසින් ලියන ලද වාක්‍ය සහ ඡේද කියවා අවශ්‍ය තොරතුරු ග්‍රහණය කර ඉදිරිපත් කරයි.<br>• ජපන් බසින් ලියන ලද වාක්‍ය සහ ඡේද නිවැරදි ව කියවා අදහස ඉදිරිපත් කරයි.<br>• අවශ්‍ය තෙරතුරු උපුටා දක්වයි | 33 |
| 6.0 අදහස් ප්‍රකාශ කිරිම සඳහා ලේඛනයේ යෙදෙයි. | 6.1 ව්‍යාකරණ රීති අනුගමනය කරමින් අර්ථාන්විත වාක්‍ය විස්තරාත්මක ව ලියයි.<br>6.2 සන්නිවේදනය සඳහා නිර්මාණාත්මක ලේඛනයේ යෙදෙයි. | • රචනා, ලිපි, දැන්වීම් ආදිය | • ව්‍යාකරණ රීති පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කරයි.<br>• අර්ථවත් වාක්‍ය නිර්මාණය කරයි.<br>• සවිස්තරාත්මක වාක්‍ය ගොඩ නගයි.<br>• අදහස් ක්‍රමානුකූල ව පෙළ ගස්වමින් නිර්මාණශීලී ව රචනා කරයි.<br>• අදහස් සහ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ලේඛනයේ යෙදෙයි. | 24 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 7.0 සන්නිවේදන කුසලතා පහසු කර ගැනීම සඳහා පරිවර්තනය කරයි. | 7.1 ජපන් බසින් සිංහල/ දෙමළ/ඉංග්‍රීසී භාෂාවට පරිවර්තනය කරයි.<br><br>7.2 සිංහල /දෙමළ/ඉංග්‍රීසී බසින් ජපන් භාෂාවට පරිවර්තනය කිරීම.<br><br>7.3 පරිවර්තනය කරනු ලබන හා පරිවර්තනයට භාජනය වන භාෂාවලට ආවේණික ලක්ෂණ හඳුනා ගෙන පරිවර්තනයේ යෙදෙයි. | • ජපන් සමාජීය හා සංස්කෘතික තොරතුරු ඇතුළත් ඡේද, ලිපි, පුවත්පත් දැන්වීම් | • කියවා අර්ථය දක්වයි.<br>• ජපන් බසින් සිංහල/දෙමළ/ඉංග්‍රීසී බසට පරිවර්තනය කරයි.<br>• සිංහල /දෙමළ/ඉංග්‍රීසී බසින් ජපන් බසට පරිවර්තනය කරයි.<br>• පරිවර්තනය කරනු ලබන හා පරිවර්තනයට ලක් වන භාෂාවලට ආවේණික විශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.<br>• භාෂාවල විශේෂතා වෙන් වෙන් ව විස්තර කරයි.<br>• භාෂාවට අනන්‍ය සුවිශේෂිතා පිළිබිඹු වන පරිදි නිවැරදි ව පරිවර්තනයේ යෙදෙයි. | 09 |
| 8.0 සාහිත්‍ය නිර්මාණ සහ කෘති රසාස්වාදනය කරයි. | 8.1 සාහිත්‍ය නිර්මාණ හා කෘති කියවා රස විඳිමින් අදහස් දක්වයි.<br><br>8.2 සාහිත්‍ය කෘති සහ නිර්මාණ රස විඳිමින් ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br><br>8.3 සරල විචාර කියවා තේරුම් ගෙන විග්‍රහ කරයි.<br><br>8.4 සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තම අදහස් විචාරශීලී ව ඉදිරිපත් කරයි. | • සාහිත්‍ය කෘති<br><br>• සරල කෙටි කතා<br><br>• පද්‍ය | • සාහිත්‍ය නිර්මාණ හා කෘති කියවා රසාස්වාදය කර අදහස් ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය කෘති සහ නිර්මාණ ආශ්‍රිත ප්‍රශ්නවලට පිළිතුරු සපයයි.<br>• සරල විචාර කියවා තම අදහස් ඉදිරිපත් කරයි.<br>• සාහිත්‍ය නිර්මාණ පිළිබඳ තම අදහස් විචාරශීලී ව ඉදිරිපත් කරයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 9.0 ජපානයේ ආචාර ධර්ම, සමාජ සම්මත, සන්නිවේදන ක්‍රමෝපාය සහ නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිත කරමින් සන්නිවේදනයේ යෙදෙයි. | 9.1 ජපානයේ සමාජ සම්මත අවබෝධ කර ගෙන භාවිත කරයි.<br><br>9.2 සන්නිවේදන ක්‍රමෝපාය සහ නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිත කරමින් අදහස් හුවමාරු කර ගනියි.<br><br>9.3 ජපන් භාෂාවේ, සංස්කෘතියේ ඇති ආචාර ධර්ම සහ සන්නිවේදන ක්‍රමෝපාය සමග තම මවු බසෙහි හා සංස්කෘතියේ ඇති සමාන-අසමානතා හඳුනා ගනිමින් සන්නිවේදනයේ යෙදෙයි. | • ආචාර කිරීමේ සහ සුබ පැතීමේ යෙදුම් සහ ක්‍රම<br><br>• නිර්වාචික සන්නිවේදන ක්‍රම<br>- සාත්ත්වික අභිනය<br>- අංග චලනය<br>- ඉරියවු ආදිය<br><br>• සිරිත් විරිත්<br><br>• සාර්ථක ව සන්නිවේදනය කිරීමේ ක්‍රමෝපාය | • නිවැරදි යෙදුම් භාවිත කර අවස්ථානුකූල ව ආචාර කරයි.<br><br>• ජපන් ජාතිකයන්ගේ නිර්වාචික සන්නිවේදන ක්‍රම භාවිත කරමින් සන්නිවේදනයේ යෙදෙයි.<br><br>• ජපානයේ ආචාර ධර්ම හා සංස්කෘතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br><br>• ජපන් ජාතිකයන්ගේ ආචාර ධර්ම, සිරිත් විරිත් ආදියට සහ සංස්කෘතියට ගරු කරමින් ඔවුන් සමඟ සන්නිවේදනයේ යෙදෙයි.<br><br>• දෙරටේ සංස්කෘතියේ සමාන-අසමානතා විචාරශීලි ව විස්තර කරයි. | 09 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 10.0 ජපන් සංස්කෘතිය හා ජන සමාජය පිළිබඳ අවබෝධයෙන් යුතු ව භාෂාව භාවිත කරයි. | 10.1 ජපාන සමාජ පද්ධතිය පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. | • ශ්‍රී ලංකාව සහ ජපානය අතර සම්බන්ධතාව<br>• උණුදිය උල්පත් | • ජපාන සමාජ පද්ධතිය පිළිබඳ ව පැහැදිලි කරයි.<br>• ශ්‍රී ලංකාව සහ ජපානය අතර සම්බන්ධතාව විස්තර කරයි. | 09 |
| | 10.2 ජපන් කළමනාකරණ සංකල්පය අවබෝධ කර ගෙන අවශ්‍ය අවස්ථාවල දී ප්‍රායෝගික ව භාවිතයට ගනියි. | • 5 S<br>• කසළ කළමනාකරණය<br>• කාල කළමනාකරණය | • ජපන් කළමනාකරණ සංකල්පය ප්‍රායෝගික ව භාවිත කරයි. | |
| | 10.3 ජපානය සහ ශ්‍රී ලංකාව අතර අන්‍යෝන්‍ය සබඳතා පිළිබඳ අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි. | • ඓතිහාසික පසුබිම<br>• වර්තමාන සබඳතා | • ජපානය සහ ශ්‍රී ලංකාව අතර ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.<br>• ජපානය සහ ශ්‍රී ලංකාව අතර වර්තමාන අන්‍යෝන්‍ය සබඳතා පිළිබඳ ව ප්‍රකාශ කරයි. | |

## 1.0 ශබ්ද සහ අක්ෂර

### 1.2 හිරගනා අක්ෂර

| | | | | |
|---|---|---|---|---|
| あ | い | う | え | お |
| か | き | く | け | こ |
| さ | し | す | せ | そ |
| た | ち | つ | て | と |
| な | に | ぬ | ね | の |
| は | ひ | ふ | へ | ほ |
| ま | み | む | め | も |
| や | | ゆ | | よ |
| ら | り | る | れ | ろ |
| わ | | | | を |
| ん | | | | |

| | | | | |
|---|---|---|---|---|
| が | ぎ | ぐ | げ | ご |
| ざ | じ | ず | ぜ | ぞ |
| だ | ぢ | づ | で | ど |
| ば | び | ぶ | べ | ぼ |
| ぱ | ぴ | ぷ | ぺ | ぽ |

| | | |
|---|---|---|
| きゃ | きゅ | きょ |
| しゃ | しゅ | しょ |
| ちゃ | ちゅ | ちょ |
| にゃ | にゅ | にょ |
| ひゃ | ひゅ | ひょ |
| みゃ | みゅ | みょ |
| りゃ | りゅ | りょ |
| ぎゃ | ぎゅ | ぎょ |
| じゃ | じゅ | じょ |
| ぢゃ | ぢゅ | ぢょ |
| びゃ | びゅ | びょ |
| ぴゃ | ぴゅ | ぴょ |

1.3 කතකනා අක්ෂර

| | | | | |
|---|---|---|---|---|
| ア | イ | ウ | エ | オ |
| カ | キ | ク | ケ | コ |
| サ | シ | ス | セ | ソ |
| タ | チ | ツ | テ | ト |
| ナ | ニ | ヌ | ネ | ノ |
| ハ | ヒ | フ | ヘ | ホ |
| マ | ミ | ム | メ | モ |
| ヤ | | ユ | | ヨ |
| ラ | リ | ル | レ | ロ |
| ワ | | | | ヲ |
| ン | | | | |

| | | | | |
|---|---|---|---|---|
| ガ | ギ | グ | ゲ | ゴ |
| ザ | ジ | ズ | ゼ | ゾ |
| ダ | ヂ | ヅ | デ | ド |
| バ | ビ | ブ | ベ | ボ |
| パ | ピ | プ | ペ | ポ |

| | | |
|---|---|---|
| キャ | キュ | キョ |
| シャ | シュ | シュ |
| チャ | チュ | チョ |
| ニャ | ニュ | ニョ |
| ヒャ | ヒュ | ヒョ |
| ミヤ | ミュ | ミョ |
| リャ | リュ | リョ |
| ギャ | ギュ | ギョ |
| ジャ | ジュ | ジョ |
| ヂヤ | ヂュ | ヂョ |
| ビャ | ビュ | ビョ |
| ピャ | ピュ | ピョ |

## ඇමුණුම iii

### 4.0 මූලික ව්‍යාකරණ රටා

### 12 ශ්‍රේණිය

| 文型（ぶんけい） | 例文（れいぶん） |
|---|---|
| N1はN2です。/ N1はN2ですか。 | 私（わたし）ははるみです。/ あなたははるみさんですか。 |
| N1はN2ではありません。/ じゃありません。 | 私（わたし）ははるみではありません。/ 私（わたし）ははるみじゃありません。 |
| N1とN2はN3です。 | 私とあやこさんは学生（がくせい）です。 |
| N1はN2が好（す）きです。/N1はN2が好（す）きではありません。 | 私（わたし）はりんごが好（す）きです。/ 私（わたし）はたまごが好（す）きではありません。 |
| N1はN2が嫌（きら）いです。 | 私（わたし）はたまごが嫌（きら）いです。 |
| N1はN2が得意（とくい）です。/N1はN2が得意（とくい）ではありません。 | 私（わたし）は日本語（にほんご）が得意（とくい）です。英語（えいご）が得意（とくい）ではありません。 |
| N1はN2が苦手（にがて）です。 | 私（わたし）はクリケットが苦手（にがて）です。 |
| N1はN3です。 N2もN3です | はるみさんは学生（がくせい）です。 あやこさんも学生（がくせい）です。 |
| N1はN2です。 | 私は17才（さい）です。 |
| これ/それ/あれはNです。 | これはノートです。 |

| | |
|---|---|
| これ/それ/あれはNですか。 | それはノートですか。 |
| これ/それ/あれはNではありません。/じゃありません。 | あれはノートではありません。/ ノートじゃありません。 |
| ここ/そこ/あそこはNです。<br>（こちら/そちら/あちら） | ここは図書館です。/ こちらは図書館です。 |
| Nはここ/そこ/あそこです。<br>（こちら/そちら/あちら） | 図書館はここです。/ 図書館はこちらです。 |
| この/その/あのN1はN2です。 | あの人ははるみです。 |
| この/その/あのN1はN2のです。 | あの本ははるみさんのです。 |
| N1はN2 にいます/あります。 | はるみさんは教室にいます。 |
| N2にN1 がいます/あります。 | 教室にはるみさんがいます。 |
| n時です/n時ではありません。 | 6時です/6時ではありません。 |
| n時ですか。 | 6時ですか。 |
| n時にVます/Vますか。 | 6に時起きます/9時に寝ますか。 |
| n時に/ごろN を/へ Vます。 | 6時半ごろごはんを食べます。 / 5時ごろうちへ帰ります。 |
| N1からN2までVます/です。 | 月曜日から金曜日まで学校へ行きます / 月曜日から金曜日まで学校です。 |

| | |
|---|---|
| あまりVません。　あまりい形くないです。<br>あまりな形ではありません。/じゃありません。 | 私(わたし)は図書館(としょかん)にあまり行(い)きません。　私(わたし)の部屋(へや)はあまり広(ひろ)くないです。<br>私(わたし)はケーキがあまり好(す)きではありません。/好(す)きじゃありません。 |
| Nが（n+助数詞(じょすうし)）あります/います。 | かさが三本(さんぼん)あります/ねこが二匹(ひき)います。 |
| Nをください。 | りんごをください。 |
| Nは〈い形(けい)〉です/（い形(けい)く）ないです。 | スリランカは小(ちい)さいです。/　スリランカは大(おお)きくないです。 |
| Nは〈な形(けい)〉です/（な形(けい)）ではありません。 | コロンボはにぎやかです。　キャンデイーはにぎやかではありません。 |
| Nがほしいです/ほしいですか。 | 車(くるま)がほしいです。/ほしいですか。 |
| N1はN2がほしがります。 | 子(こ)どもはお菓子(かし)がほしがります。 |
| N助詞(じょし)Vたいです/たいですか。 | 私(わたし)は音楽(おんがく)を聴(き)きたいです　/　聴きたいですか。 |
| N助詞(じょし)Vたがります。 | 子(こ)どもは甘(あま)い食(た)べ物(もの)を食(た)べたがります。 |
| n＋序数詞(じょすうし)で～〈金額(きんがく)〉です。 | このりんごは3つで３００円(さんびゃくえん)です。 |
| N1はN2です。 | 今日(きょう)は６月１日(ろくがつついたち)です。 |

| | |
|---|---|
| NはVました/ませんでした。 | 私は昨日ゴールへ行きました。/ はるみさんはおととい学校へ来ませんでした。 |
| Nと（一緒に）Vます/ました。 | 姉と一緒に話します。 / 母と一緒に料理を作りました。 |
| Nは い形（かった）です。 | このサリーは高かったです。 |
| Nは な形 でした。 | 日本の町はきれいでした。 |
| Vましょう/ませんか。 | 図書館に行きましょう。/行きませんか。 |
| V てください。/てくださいませんか。 | 地図を見てください。/窓を閉めてくださいませんか。 |
| N でV です。 | 木で作った机です。 |
| い形（く）/な形（に） Vます。 | 中川先生は少し速く 話しました。 |
| もう/い形/な形です。/ まだVいます。/いません。 | もう、涼しいです。/ まだ、終わっていません。 |
| V ても いいですか。 | 辞書を見ても いいですか。 |
| V＋たことがあります。 | 私は日本に行ったことがあります。 |
| N（場所）にVますか。 | 動物園に行ったことがありますか。 |

| | |
|---|---|
| V1たり、V2たりします。 | 食べたり、飲んだりします。 |
| NをVます。 | 家を出ます。 |
| 疑問詞＋かVます。 | 何か食べます。 |
| 疑問詞＋もVません。 | だれにも会いませんでした。 |
| NをVこと | お菓子を作ること |
| Vています。　（継続/習慣/結果の継続） | おやつを食べています。　ゴールに住んでいます。　私は中川先生を知っています。 |
| N1は/が～です/ます。 | 桜の花は（が）きれいです。 |
| Nだけ | カスン君だけ来ませんでした。 |
| S1から、S2 | 風邪ですから、私は学校へ行きません。 |
| Vないでください。 | 飲まないでください。 |
| N1はN2がA/ANです。 | ともこさんは髪が長いです。 |
| N1はA/AN　N2 | ともこさんは髪が長い　女の人です。 |

| | |
|---|---|
| Nができます。 | 私は運転ができます。 |
| Vことができます。 | 私は泳ぐことができます。 |
| い形くて、い形です。 | このかばんは　青くて、大きいです。 |
| な形で、な形です。 | にぎやかで、元気な先生は中川先生です。 |
| N1がV1てから、N2は/がV2ます。 | 学校が終わってから、ともこさんは塾へ行きます。 |
| V1て、V2ます。 | 私は毎日歩いて、学校へ行きます。 |
| V1ないで、V2ます。 | はるみさんは学校へ行かないで、家にいます。 |
| N1はN2にVます。 | はるみさんはともこさんに本を貸します。 |
| N1が　V1（辞書形）前に、N2は/がV2ます。<br>N3の前に、N2は/がV2ます。 | シェーン君がマレーシアへ留学する前に、サチ二さんは日本へ留学します。<br>授業の前にはるみさんは宿題を出します。 |
| N1がV1た後で、N2は/がV2ます。<br>N3の後で、N2は/がV2ます。 | パーティが終わった後で、私は部屋を片付けます。<br>授業の後で、はるみさんはそうじをします。 |

| | |
|---|---|
| Nが V N2 | これは私(わたし)が授業(じゅぎょう)で使う(つか)本(ほん)です。 |
| Sと思(おも)います。 | 明日(あした)は雨(あめ)がふると思(おも)います。 |
| N1は/が N2になります。N1は/が い形(けい)くなります。 | はるみさんは来年(らいねん)13年生(ねんせい)になります。 マンゴーの木(き)が大(おお)きくなります。 |
| Sでしょう。 | もう、家(うち)へ帰(かえ)るでしょう。 |
| N1がV1のとき、N2は/がV2ます | 私がご飯(はん)を食べているとき、友達(ともだち)が家(いえ)へ来(き)ました。 |
| い形/な形とき、N1はVます。 | うれしいとき、私(わたし)は歌(うた)を歌(うた)います。 |
| V1ながらV2ます。 | 私(わたし)は歌(うた)を歌(うた)いながら帰(かえ)りました。 |
| NがVてあります。 | 電気(でんき)が消(け)してあります。 |
| NしかVません。 | この町(まち)にはホテルがひとつしかありません。 |
| Nで、Vます。 | はるみさんは病気(びょうき)で、学校(がっこう)を休(やす)みました。 |

13 ශ්‍රේණිය

| 文型(ぶんけい) | 例文(れいぶん) |
|---|---|
| [S]んです。 | 歯(は)が[痛(いた)い]んです。 |
| [V]た/ない　ほうがいいです。 | 今日(きょう)はかさを[持(も)っていった]ほうがいいです。/[行(い)かない]ほうがいいです。 |
| [V]ては　いけません。 | うそを[つい]ては　いけません。 |
| [V]てみます。 | おはしを[使(つか)っ]てみました。 |
| [V]方(かた) | ごみの[出(だ)し]方(かた)がわかりません。 |
| [N1]は/が　[N2]に[N3]をあげます。 | [サジャーニさん]は[みゆきさん]に[ペン]をあげました。 |
| [N1]は/が　[N2]に[N3]をもらいます。 | [みゆきさん]は[サジャーニさん]に[ペン]をもらいました。 |
| [V]なければなりません。 | 学校(がっこう)の規則(きそく)を[守(まも)ら]なければなりません。 |
| [N]までに[V] | [18才(さい)]までにバイクの免許(めんきょ)を[取(と)ります]。 |
| [V]なくてもいいです。 | 毎日(まいにち)、運動着(うんどうぎ)を[持(も)ってこ]なくてもいいです。 |
| [V]てしまいます。 | はるみさんは一日で漢字(かんじ)を 100 個[覚(おぼ)え]てしまいました。 |

| | |
|---|---|
| い形/な形/ Vすぎます。 | 宿題が多すぎます。 |
| N1は N2たら、S2 | 私はすしだったら、食べられます。 |
| N1が い形/ な形たら、S2 | 車が安かったら、買いたいです。 |
| N1がN2で/い形くて も S2 | 子どもでも同じ料金を払わなければなりません。 |
| N1がな形で/Vて も S2 | 野菜がきらいでも食べたほうがいいですよ。 |
| S1 も S2 | 雨が降っても、花火大会を中止にしません。 |
| N1を い形く N2にします。 | このマンゴーを安くしてください。 |
| な形に N2にします。 | 図書館では静かにします。 |
| Vように します。 | すぐに火を消すようにします。 |
| N1とN2と（では）どちらのほうがい形/な形/Vか。 | この店は魚料理と肉料理と、どちらがのほうがおいしいですか。 |
| N1とN2と（では）、どちら助詞Vか。 | 航空便と船便と、どちらで送りますか。 |
| N1よりN2のほうがい形/な形/V。 | バスよりスリウイラーのほうが便利です。 |

| | |
|---|---|
| N1はN2ほど　い形/な形/Vない。 | コロンボはアヌラーダプラほど広くないです。 |
| SかどうかV | ここが私たちの教室かどうか確かめましょう。 |
| N1は疑問詞N2/い形/な形/V1かV2 | かばんをどこで売っているのか電話で聞きました。 |
| N1というN2 | 「カステラ」というお菓子を食べました。 |
| N2は/をN1　といいます。 | このお菓子を「カステラ」といいます。 |
| 疑問詞+でも　N/い形/な形/V | いつでもうちに来てください。 |
| N1は/がN2/い形/　な形/Vので | 今日は　日曜日なので、学校は休みです。 |
| SとV | 答えがわからないので、「わからない。」と答えました。 |
| Nの/V1　ために　V2 | 健康のためにジョギングしています。 |
| Sかもしれません。 | 時間を間違えたかもしれません。 |
| Vの | 魚が泳いでいるのが見えます。 |
| S1（N1がN2　い形　な形V）とS2 | お金を入れると切符が出てきます。 |

| | |
|---|---|
| い形(けい)/な形(けい)/V　そうです。 | 友(とも)だちはとても嬉(うれ)しそうでした。 |
| NをVておきます。 | もう一度(いちど)テキストを読(よ)んでおきます。 |
| N/Vこと　に　します。 | 日本語(にほんご)を勉強(べんきょう)することにしました。 |
| N/Vこと　になります。 | 制服(せいふく)を着(き)ることになっています。 |
| Sそうです。 | はるみさんのお兄(にい)さんは医者(いしゃ)だそうです。 |
| N1は/が　N2にVてくれます/もらいます。 | ラーダさんのお母(かあ)さんは私(わたし)にケーキを作(つく)ってくれました。 |
| N1がN2/い形/な形/V　のにS2 | 雨季(うき)なのに雨(あめ)が全然(ぜんぜん)降(ふ)りません。 |
| S1のにS2 | 風邪(かぜ)で熱(ねつ)があるのに学校(がっこう)へ行(い)きました。 |
| Vようになります。 | インターネットで世界(せかい)のニュースを見(み)るようになりました。 |
| N1はN2/い形(けい)/な形(けい)/Vみたいです。 | 田中(たなか)さんはねこが好(す)きみたいです。 |
| N1はN2　/い形(けい)/な形(けい)/Vようです。 | 田中(たなか)さんはねこが好(す)きなようです。 |
| Vやすい/にくいです。 | このペンは書(か)きやすいです。 |

| | |
|---|---|
| Vて　きました。/　いきます。 | ケーキを買(か)ってきました。 |
| 先生(せんせい)はお帰(かえ)りになりました。 | |
| 私(わたし)がその荷物(にもつ)をお持ちしましょう。 | |
| よろしくお願(ねが)いします。 | |

## ඇමුණුම iv

### 5.0 කන්ජි අක්ෂර

### 12 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| 1課 | 数字と関係のある漢字　15 | 一　二　三　四　五　六　七　八　九　十　百　千　万　円　才 |
| 2課 | 人間関係を表す漢字　6 | 人　男　女　友　両　親 |
| 3課 | 曜日と関係のある漢字　10 | 日　月　火　水　木　金　土　曜　毎　週 |
| 4課 | 方向をや位置を表す漢字 14 | 上　下　中　外　間　内　左　右　北　南　西　東　側　方 |
| 5課 | 家族　10 | 私　家　族　母　父　子　兄　姉　弟　妹 |
| 6課 | 時を表す漢字　15 | 分　半　今　昔　前　後　朝　昼　晩　夜　夕　午　年　時　以 |
| 7課 | 形容詞　I　10 | 大　小　高　安　近　早　白　黒　赤　青 |
| 8課 | 形容詞　II　10 | 明　暗　悪　新　古　長　多　少　主　忙 |
| 9課 | 形容詞　III　11 | 重　強　暑　寒　温　太　若　痛　好　広　正 |
| 10課 | 体　11 | 体　目　耳　口　歯　手　足　心　頭　顔　首 |
| 11課 | 学校　16 | 習　教　学　校　本　語　紙　服　先　生　門　文　字　宿　題　仏 |
| 12課 | 天気と季節を表す漢字　8 | 天　気　雨　雪　春　夏　秋　冬 |
| 13課 | 動物と植物　6 | 犬　馬　鳥　牛　草　果 |
| 14課 | 日常動作 I　9 | 行　来　帰　見　食　飲　寝　起　立 |

13 ශ්‍රේණිය

| | | |
|---|---|---|
| 15課 | 日常動作Ⅱ　10 | 書　読　聞　話　言　歩　走　出　入　遊 |
| 16課 | 地形　9 | 山　石　地　田　平　野　原　川　海 |
| 17課 | 自然を表す漢字　11 | 林　森　竹　池　花　空　星　光　風　力　自 |
| 18課 | 食べ物と飲み物　9 | 料　理　酒　茶　飯　米　肉　魚　味 |
| 19課 | 場所を表す漢字　11 | 部　屋　公　園　図　館　室　寺　工　場　所 |
| 20課 | 職場　6 | 社　銀　駅　病　院　店 |
| 21課 | 漢字の組合わせ　10 | 色　有　名　元　単　特　別　品　荷　物 |
| 22課 | 交通　12 | 電　車　転　急　発　飛　乗　降　予　約　番　号 |
| 23課 | 動詞Ⅰ　6 | 思　考　覚　忘　決　困 |
| 24課 | 動詞Ⅱ　11 | 住　死　休　知　貸　借　返　作　使　働　数 |
| 25課 | ペアになる動詞　10 | 開　閉　問　答　押　引　始　終　買　売 |
| 26課 | 他動詞・自動詞のある動詞 8 | 落　建　当　集　動　受　取　付 |
| 27課 | する動詞　6 | 結　婚　反　対　卒　業 |
| 28課 | 職業　8 | 医　者　員　画　仕　事　旅　歌 |
| 29課 | 同じ訓読みのある漢字Ⅰ 8 | 会　合　切　着　写　映　表　現 |
| 30課 | 行政区分　11 | 村　町　都　道　府　県　京　島　国　世　界 |
| 31課 | 教育　9 | 留　英　研　究　験　勉　点　能　面 |
| 32課 | 同じ訓読みのある漢字Ⅱ 6 | 変　代　量　計　止　泊 |

| | | |
|---|---|---|
| 33課 | 接尾辞・接頭辞　10 | 最　無　不　全　第　真　化　性　的　用 |
| 34課 | 形の似ている漢字Ⅰ　6 | 待　持　度　席　何　同 |
| 35課 | 形の似ている漢字Ⅱ　6 | 運　連　楽　薬　法　去 |
| 36課 | 部首Ⅰ －サンズイ　8 | 消　泳　注　活　洗　漢　油　洋 |
| 37課 | 部首Ⅱ －イトヘン、ゴンベン、　シンニョウ　8 | 糸　続　練　説　試　選　通　送 |

## ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය

1. ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා කේවල සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කිරීම.

   - අක්ෂර කාඩ්පත් භාවිතය

   - රූප කාඩ්පත් භාවිතය

   - විනෝදාත්මක ක්‍රීඩා යොදා ගැනීම

2. සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස සිදු කරවීම.

3. යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් හෝ සංවාද පුහුණුවෙහි යෙදවීම.

4. අන්තර්ජාලය පරිහරණයෙන් ජපන් භාෂා ඥානය වර්ධනය කර ගැනීම.

## පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

ජපන් භාෂාව හදාරමින් දැනුම, ආකල්ප හා කුසලතා භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්ය ක්‍රියාත්මක කළ හැකි ය.

1. **ජපන් භාෂා දිනය** පැවැත්වීම.
2. ජපන් සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.
3. ස්වනිර්මාණ ද ඇතුළත් කර '**ජපන් බිත්ති පුවත්පතක්** නිර්මාණය කිරීම.
4. පාඨශාලාව තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ ජපන් බසින් රචනා, නාට්‍ය, කථික ආදි තරග පැවැත්වීම.
5. ජපන් භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා එම විෂයයෙහි ප්‍රවීණ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

## තක්සේරුව හා ඇගයීම

- පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත යි.

- 13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ. පො. ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය.

- මෙම විෂය නිර්දේශය පදනම් කර ගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමු වරට 2019 වර්ෂයේ දී පැවැත්වේ.

- මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මඟින් සැපයෙනු ඇත.

## නිර්දිෂ්ට ග්‍රන්ථ

1. 12 ශ්‍රේණිය සඳහා නිර්දිෂ්ට ග්‍රන්ථය Sachinisan to Ishshoni Part I
2. 13 ශ්‍රේණිය සඳහා නිර්දිෂ්ට ග්‍රන්ථය Sachinisan to Ishshoni Part 2
3. 日本語の文字　ひらがな　カタカナ　漢字 for G.C.E. Advance Level

## පරිශීලනීය ග්‍රන්ථ

1. Pupil's Book for Japanese G.C.E (A/L), Reading & Comprehension Revised Edition, NIE, 2008

## ජපන් විෂය නිර්දේශය සම්පාදක මණ්ඩලය 2017

**උපදේශකත්වය හා අනුමතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**සම්බන්ධීකරණය** : එච්. කේ. ගීතිකා සෙනෙවිරත්න මිය
සහකාර කථිකාචාර්ය,
ජාතික අධ්‍යාපන ආයතනය.

**ලේඛක මණ්ඩලය :-**

**අභ්‍යන්තර :-**

(1) මධුභාෂිණී දෙල්දෙණිය මිය, ශාස්ත්‍රවේදී ප්‍රථම පන්ති (ගෞරව), ශාස්ත්‍රපති, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය.

(2) එච්.කේ. ගීතිකා සෙනෙවිරත්න මිය, ශාස්ත්‍රවේදී ප්‍රථම පන්ති (ගෞරව), ශාස්ත්‍රපති,
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය.

(3) කොගා මෙයිකො මිය, ජ්‍යෙෂ්ඨ ස්වේච්ඡා ගුරු, (JICA),
ජාතික අධ්‍යාපන ආයතනය

**බාහිර**

(1) ආචාර්ය දිල්රුක්ෂි රත්නායක මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
නූතන භාෂා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.

(2) ආචාර්ය සමන්තිකා ලොකුගමගේ මිය, කථිකාචාර්ය,
උසස් ඉදිකිරීම් පුහුණු ආයතනය, ඉදිකිරීම් තාක්ෂණ විශ්වවිද්‍යාලයීය ආයතනය, බත්තරමුල්ල.

(3) සඳමාලි අමරසිරි ගුණවර්ධන මිය, ශාස්ත්‍රවේදී ප්‍රථම පන්ති (ගෞරව)
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07.

(4) අයි.ඩී. ඩබ්. රත්නායක මිය, ශාස්ත්‍රවේදී (ගෞරව) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07.

(5) වත්සලා ද සිල්වා මෙය, ශාස්ත්‍රවේදී ප්‍රථම පන්ති (ගෞරව), ශාස්ත්‍රපති,
උසස් බාලිකා විද්‍යාලය, ගල්කිස්ස

(6) කමණි නිලූෂා දෙල්පච්ත්‍ර මිය, ශාස්ත්‍රවේදී
පාණදුර රජකීය විද්‍යාලය, පානදුර

(7) එල්.ඩබ්.එල්.එම්.ආර්. කුමාරි මිය, ශාස්ත්‍රවේදී ,පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
ශාන්ත පාවුලු විද්‍යාලය, මිලාගිරිය, කොළඹ 05

(8) ඒ.සී. හේවගේ මිය, ශාස්ත්‍රවේදී , පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා
ආනන්ද විද්‍යාලය, කොළඹ 10.

**භාෂා සංස්කරණය**

(1) ඊ. ආර්. එන්. ප්‍රේමකුමාර මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, සිංහල භාෂා දෙපාර්තමේන්තුව,
ජාතික අධ්‍යාපන ආයතනය

(2) ශ්‍රීනාත් ගණේවත්ත මහතා, සිංහල භාෂා සංස්කාරක